සමෘද්ධි සංවර්ධන
දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

මගේ අංකය / எனது இல / My No: DDD/HO/03/ACC/14/Deli-2017
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2017.06.29

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරින්
සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්
සියළුම ප්‍රවර්ධන නිලධාරිවරුන්

## සමෘද්ධි සහනාධාර වැඩසටහන - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

සමෘද්ධි සහනාධාර වැඩසටහන සම්බන්ධව නිකුත් කරන ලද මාගේ ගිණුම් චක්‍රලේඛ අංක 08/2017 ට අනුව 01) 1.1 -iv, 1.3 – I, 1.6 හා චක්‍රලේඛයේ 4 වන්තිය අනුව පහත සංශෝධනයන් සිදුකරන ලදි.

02. එම චක්‍රලේඛයේ 1.1.iv මගින් වයස අවු. 18 සම්පූර්ණ කර ඇති පූජ්‍ය පක්ෂයේ සහනාධාර ලාභීන් වයස අවු. 18 ඉක්මවූ විටකදී එම පූජ්‍ය පක්ෂයේ සහනාධාරලාභියා නමින් කේවල ගිණුම් ආරම්භ කළ යුතුය යන්න උපදෙස් දී ඇති අතර, එම උපදෙස් මෙයින් අවලංගු කරන අතර, මින් ඉදිරියට වයස අවු. 18 සම්පූර්ණ කළද සියළුම පූජ්‍ය පක්ෂයේ සහනාධාර මුදල් එම ආගමික ස්ථානයභාර ස්ථානභාර නිලධාරිගේ (විහාරාධිපති, පරිවේනාධිපති, මෙහෙනින්වහන්සේ, ප්‍රධාන කන්‍යා සොයුරිය, ප්‍රධාන පාලක පියතුමා, මවුලවි තුමා හෝ අයියර් තුමා) ගිණුමට බැරකළ යුතුය.

03. එම චක්‍රලේඛයේ 1.3 යටතේ වැඩිහිටි නිවාස / ළමා නිවාස හා ආබාධිත නිවාස වල නේවාසිකව සිටින්නන් සඳහා සහනාධාර ලබාදීමේදී ඔවුන් තනි පුද්ගලයන් සේ සලකා සහනාධාර ලබාදිය යුතු අතර, ඔවුන්ගේ මුදල් ඉදුරාම ආයතනයේ ප්‍රධාන පාලක / පාලිකාවගේ නමින් බැරකළ යුතුය.

04. එසේම 1.6. වගන්තිය යටතේ සහනාධාර අත්හිටුවීමට/අවලංගු කිරීමට හේතුවන කරුණු යටතේ 1.6.4 මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් හෝ වෙනත් කුමන හෝ ආකාරයක විශ්‍රාම වැටුපක් ලබාගන්නා පුද්ගලයින්ගේ සහනාධාරය අහිමිකළ යුතුය යන්න උපදෙස් ලබාදී ඇත. එම වගන්තිය අවලංගු කරන අතර, රජයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාම වැටුපක් ලබාගන්නා ප්‍රතිලාභින්ගේ පමණක් සහනාධාරය අවලංගු කළ යුතු අතර, අනෙකුත් කුමන හෝ ආකාරයේ විශ්‍රාම වැටුපක් ලබන පුද්ගලයින්ගේ සහනාධාර අහිමි නොකළ යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

05. තව ද චක්‍රලේඛයේ 4 වගන්තිය අනුව සහනාධාර මුදල් ගිණුම්ගත කිරීම යටතේ ප්‍රතිලාභියා නමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ ගිණුමක් තිබීම අනිවාර්ය වන අතර, එම ගිණුම මගින් සියළුම මුදල් ගිණුම් ගත කළයුතු බවත් ගෘහමූලිකයා මියගිය අවස්ථාවකදී කලත්‍රයා / ප්‍රාදේශීය ලේකම් නම්කරන අයෙකු නමින් ගිණුමක් විවෘත කළ යුතු බවටත් උපදෙස් ලබාදී ඇත. එහෙත් බොහෝ සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් ඔවුන්ගේ කලත්‍රයා විසින් ණය ලබාගෙන ඇති බැවින් ප්‍රතිලාභියාගේ කැමැත්ත සඳහන් ලිපියක් මගින් කලත්‍රයා විසින් ලබාගත් ණය මුදල් අදාල ප්‍රතිලාභියාගේ ගිණුමෙන් පියවා ගැනීමට කටයුතු කළ හැකිය, වශයෙන් එම වගන්තියට අතිරේක උපදෙස් නිකුත් කරනු ලැබේ.

06. උක්ත චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් උපදෙස් නොවෙනස්වන අතර, ඉහත සංශෝධන යටතේ ලබාදී ඇති නව උපදෙස් අනුව කටයුතු කිරීමට සටහන් කරගන්නා මෙන් කාරුණිකව දන්වමි.

**නීල් බණ්ඩාර හපුහින්න**

**අධ්‍යක්ෂ ජනරාල්**

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් :- | 01. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| | 02. | ලේකම් , රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| | 03. | ලේකම් , ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| | 04. | ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | - | කා.දැ.පි. |
| | 05. | විගණකාධිපති | - | කා.දැ.පි. |